Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ව්‍යාපාර අධ්‍යයනය

සතිය- 1

ශ්‍රේණිය-13

සකස් කළේ - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

නිපුණතාව 12.0 - පුද්ගලයන්ගේ හා සංවිධානවල පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීම සඳහා කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම 12.1 - කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම තහවුරු කරයි.

## <u>කළමනාකරණය -</u>

කළමනාකරණය යනු ගතික ව්‍යාපාර පරිසරය තුළ සංවිධානයක ප්‍රකාශිත පරමාර්ථ හා අරමුණු සඵලදායීව ඉටු කර ගැනීම සඳහා සංවිධානය සතු සම්පත් කාර්යක්ෂමතාවෙන් සැලසුම්කරණය,සංවිධානකරණය,මෙහෙයවීම හා පාලනය ඇතුළත් ඵලදායී ක්‍රියාවලියකි.

## <u>ගතික ව්‍යාපාර පරිසරය -</u>

විවිධ අවස්ථාවන්හි නිරන්තර වෙනස්වීම්වලට භාජනය වෙමින් පවතින අභ්‍යන්තර හා බාහිර පරිසරය ගතික ව්‍යාපාර පරිසරයයි.

## <u>ආයතන/සංවිධාන</u>

යම් පරමාර්ථයක් හෝ පරමාර්ථ කිහිපයක් හෝ ඉටු කර ගැනීම සඳහා එක්ව වැඩ කරන පුද්ගලයන්ගේ එකතුවක් සංවිධානයක් ලෙස සරලව හැඳින්විය හැකිය.

## <u>පරමාර්ථ හා අරමුණු -</u>

ආයතනයක් දිගුකාලයකදී ළඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල පරමාර්ථ ලෙස හැඳින්විය හැකිය.

පුළුල් වූ ආයතනික පරමාර්ථයකට අදාළ ප්‍රතිඵලය වඩාත් නිශ්චිත ආකාරයෙන් ප්‍රකාශ කරන්නේ නම් එය අරමුණක් ලෙස හැඳින්විය හැකිය.

## <u>අභ්‍යාස</u>

1.ව්‍යාපාර සම්පත් ආකාර දෙකකට වර්ග කර දක්වන්න.

2.සඵලදායකත්වය හා කාර්යක්ෂමතාවය යන පද පැහැදිලි කරන්න.

3.ඵලදායකත්වය යනු කුමක්ද?